**කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව**
**ශාස්ත්‍ර පීඨය**
**ශාස්ත්‍රවේදී විශේෂ උපාධි පරීක්ෂණය - දෙවන භාගය**
**පළමු සෙමෙස්තර අවසාන පරීක්ෂණය - 2019**

# GYG 3148 – කෘෂිකර්මය, කර්මාන්ත සහ ජනාවාස

**කාලය පැ 02 යි**

එක් කොටසකින් එක් ප්‍රශ්නය බැගින් ප්‍රශ්න තුනකට (03) පමණක් පිළිතුරු සපයන්න.

---

## පළමු කොටස

(01)

i. කෘෂිකර්මාන්තයේ ව්‍යාප්තිය කෙරෙහි බලපාන භෞතික හා මානව සාධක දෙක (02) බැගින් සඳහන් කරන්න. (ලකුණු 02)

ii. ඉහත (i) හි ඔබ සඳහන් කළ එක් (01) භෞතික සාධකයක් කෘෂිකර්මාන්තයේ ව්‍යාප්තිය කෙරෙහි බලපා ඇති ආකාරය තෝරාගත් එක් රටක් ඇසුරෙන් (ශ්‍රී ලංකාව හැර) කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04)

iii. කෘෂිකාර්මික කටයුතුවල විවිධත්වය කෙරෙහි සමාජ ආර්ථික හේතු බලපාන ආකාරය නිදසුන් දෙකක් (02) ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

iv. "කෘෂිකර්මාන්තයේ ව්‍යාප්තිය කෙරෙහි පිහිටීම් සාධක (locational factors) අතීතයේ දී බලපෑ ලෙසින්ම වර්තමානයේ දී බලපාන්නේ නැත" මෙම කියමන සුදුසු උදාහරණ ඇසුරින් සාකච්ඡා කරන්න. (ලකුණු 08)

(02)

i. කෘෂිකාර්මික ඉල්ලුම් සහ සැපයුම් වක්‍රය (Agriculture demand and supply curves) රූප සටහනක් මගින් දක්වන්න. (ලකුණු 02)

ii. නිෂ්පාදන ප්‍රමාණය තීරණය වීමෙහිලා කෘෂිකාර්මික යෙදවුම් බලපාන ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

iii. කෘෂිකර්මාන්තයේ දී ආදායම උපරිම කර ගැනීමට ගොවීන්ට අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග තුනක් (03) විස්තර කරන්න. (ලකුණු 06)

iv. වොන් තියුනන්ගේ කෘෂිකාර්මික ආදර්ශකයට අනුව ලාභ උපරිම කර ගැනීම සඳහා වෙළෙඳපොළ සිට ඇති දුර යන සාධකය පමණක් පදනම් කරගෙන බෝග සංයෝග කළ යුතු ආකාර හඳුනාගැනීමේ ඇති යෝග්‍යතාවය විවේචනාත්මකව අගයන්න. (ලකුණු 08)

## <u>දෙවන කොටස</u>

(01)

I. තාක්ෂණය මත පදනම්ව කාර්මිකරණයේ ප්‍රධාන අවධි හතර (04) නම් කරන්න.
(ලකුණු 02)

II. කාර්මික විප්ලවයට පෙර කර්මාන්තවල තත්ත්වය කෙබඳු දැයි කෙටියෙන් විස්තර කරන්න.
(ලකුණු 04)

III. පළමු කාර්මික විප්ලවය කෙරෙහි කෘෂිකර්මාන්තය දායක වූ ආකාරය පැහැදිලි කරන්න.
(ලකුණු 06)

IV. කාර්මිකරණයේ ප්‍රතිඵල සිව්වන කාර්මික විප්ලවය ඇසුරින් සාකච්ඡා කරන්න.
(ලකුණු 08)

(02)

I. "කර්මාන්ත සිදු කිරීමේ දී භූමිය ක්ෂේත්‍රීය වශයෙන් සංචලනය කළ නොහැකි (spatially non-mobile) වුවත් ආර්ථික වශයෙන් සංචලනය කළ හැක (economically mobile)" මෙමගින් අදහස් කරන්නේ කුමක්දැයි කෙටියෙන් සඳහන් කරන්න. (ලකුණු 02)

II. කර්මාන්ත සඳහා ශ්‍රමය සපයා ගැනීමේ දී පිහිටීමේ සාධකය වැදගත් වන අයුරු කරුණු දෙකක් ඇසුරෙන් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

III. කර්මාන්තවල ස්ථානීය පිහිටීම තීරණය කිරීමෙහිලා බලපාන සාධක විමසීමේ දී ඔබ උගත් එක් පිහිටීම් ආදර්ශකයක් භාවිතා කළ හැකි ආකාරය විමසන්න (ලකුණු 06)

IV. ශ්‍රී ලංකාව තුළ කර්මාන්ත ස්ථාන ගත වීම කෙරෙහි දේශපාලනික සාධක බලපා ඇති ආකාරය සාකච්ඡා කරන්න . (ලකුණු 08)

## තෙවන කොටස

(01)

i. ජනාවාස ධූරාවලිය නම් කරන්න. (ලකුණු 02)

ii. ජනාවාස ධූරාවලිය සැකසීමේ දී ජන සංඛ්‍යාව පදනම් කර ගන්නා ආකාරය කෙටියෙන් විමසන්න. (ලකුණු 04)

iii. ජනාවාස වර්ධනය කෙරෙහි ස්ථානීය සාධක (Site factors) බලපා ඇති ආකාරය ශ්‍රී ලංකාව ඇසුරින් සාකච්ඡා කරන්න. (ලකුණු 06)

iv. "ජනාවාසයක සැකැස්ම හා ප්‍රමාණය අවබෝධ කර ගැනීමේ දී භාවිතා කළ හැකි යෝග්‍යතම ආදර්ශකය වෝල්ටර් ක්‍රිස්ටාලර්ගේ කේන්ද්‍රස්ථාන ආකෘතියයි" මෙම ප්‍රකාශය සාකච්ඡා කරන්න. (ලකුණු 08)

(02)

i. නාගරික රූප විද්‍යාව (Urban morphology) යන්න නිර්වචනය කරන්න. (ලකුණු 02)

ii. නාගරික රූප විද්‍යාව (Urban morphology) හඳුනා ගැනීම සඳහා භාවිත කළ හැකි ආදර්ශක 02 ක් රූපසටහන් මගින් දක්වන්න. (ලකුණු 04)

iii. නාගරික රූප විද්‍යාව (Urban morphology) හඳුනා ගැනීම සඳහා ඉහත (ii) හි ඔබ සඳහන් කළ එක් ආදර්ශකයක් යොදාගත හැකි ආකාරය පහදන්න. (ලකුණු 06)

iv. "නාගරික භූමි පරිභෝග ආදර්ශක මගින් නිරූපණය වන්නේ හුදෙක් නාගරික භූමි පරිබෝගය හෝ නාගරික සැකැස්ම පමණක් නොව නගරවාසීන්ගේ සමාජ ආර්ථික තත්ත්වයයි" මෙම කියමන නිදසුන් සහිතව සාකච්ඡා කරන්න. (ලකුණු 08)

---